
## නව විශේෂාංගය



# සංවර්ධනය වන රටවල ගොවි ගුවන් විදුලි සේවයෙන්

කෘෂිකර්මාන්තයේ නියැලෙන ඔබ වෙනුවෙන් "ගොවිජනතාව" මෙවර නව විශේෂාංගයක් එක් කරයි. එමගින් ඔබගේ මෙම ප්‍රකාශනය, සංවර්ධනය වන රටවල කෘෂිකර්මයේ ප්‍රගතිය සඳහා වෙන් වූන ලෝක සංනිවේදන සංවිධානයක් හා සම්බන්ධ වෙයි. මෙම සංවිධානය කැනඩාවේ මූලස්ථානය පිහිටුවා ඇති "සංවර්ධනය වන රටවල ගොවි ගුවන් විදුලි සේවාවය. තුන්වැනි ලෝකයේ රටවල් බොහොමයක් මගින් විකාශනය කෙරෙන මෙම වැඩ සටහන් සිංහලයෙන් මුද්‍රණය වන පළමුවැනි අවස්ථාව මෙය වෙයි.

පොහොර භාවිතය වෙනුවෙන් වෙන් වූන මෙම කලාපයේ, අප ඉහත සඳහන් කෙරෙනු වැඩ සටහනින් උපයෝගී කර ගත්තේ ගොවිජනතාවට මිලක් නොගෙවා ලබාගත හැකි එනම් පොහොර පිළිබඳව හඳුන්වා දීමටය.

ඔබට ඉතා පහසුවෙන් සකසා ගත හැකි මෙම පොහොර සකස් කිරීමේ ක්‍රමය ඔබත් අත්හදා බලන්න. චීනයේ ගොවි ජනතාව ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරන මෙම පොහොර භාවිතයෙන් ඔබට ලැබෙන ප්‍රතිඵල පිළිබඳව අපට දන්වා එවන්න.

→

# ඔබට අළුත් පොහොර වර්ගයක්

එළවළු, භෝග හෝ පලතුරු වැනි කුමන භෝගයක් වගා කළත්, එම වගාවන්ට පොහොර යෙදුවහොත් වැඩි අස්වැන්නක් ලබන බව ඔබට ප්‍රත්‍යක්ෂ කරුණක්. කොම්පෝස්ට්, සතුන්ගෙන් ලැබෙන පොහොර ආදී වශයෙන් විවිධ පොහොර වර්ග තිබෙන බව ඔබ දන්නවා. මේ පොහොර වලට ඔබට මිල ගෙවන්නට සිදු වන්නේ නැහ.

මෙම පොහොර වලට යම් කිසි ක්‍රියා දමයක් නොකළහොත්, එහි අඩංගු නයිට්‍රජන් ප්‍රමාණය පැලයට ලබා ගැනීමට පෙර විනාශවී යන බව ඔබ දන්නෙහි ද? මෙම ප්‍රශ්නය විසඳීම සඳහා චීන මහජන සමූහාණ්ඩුවේ සමහර ගොවියන් පොහොර භාවිතයේදී විශේෂ ක්‍රමයක් අනුගමනය කරති. අද සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වන්නේ ඒ පිළිබඳවයි.

පළමුවෙනි කාරණය, වගාවන්ට ඔවුන් අළුත් සත්ත්ව පොහොර යොදන්නේ නැත. එම පොහොර භාවිතා කිරීමට පෙර ඔවුහු විශේෂ ක්‍රමයක් භාවිතා කර පොහොර සකසනවා. මෙම සකස් කළ පොහොර උසස් මට්ටමක් පවතින නිසා, එමගින් ඉතා උසස් මට්ටමකට පලදාවක් ඔවුන් ලබා ගන්නවා.

මෙම ක්‍රමය පිළිබඳව සාකච්ඡා කිරීමට පෙර චීන ගොවියන් අළුත් පොහොර, භාවිතා නොකරන්නේ මන්දයි වටහා ගැනීම වැදගත්. අළුත් සත්ව පොහොරවල විෂබීජ වැනි විනාශකාරී ද්‍රව්‍ය තිබී ඒවා පැතිර යා හැකියි. වගාවට පොහොර යොදන්නට පෙර ඔබ සිතිය යුතු කරුණකි මෙ.

එසේ නම්, සත්ත්ව පොහොර ඉතා හොඳ පොහොර බවට පත්කර ගන්නේ කෙසේද? චීන ගොවියන් එය කරන්නේ මෙලෙසයි. ඔබටත් එය කරන්නට උත්සාහ කරන්න පුළුවනි.

මෙම පොහොර සකස් කිරීමේ ක්‍රමයට ද්‍රව්‍ය දෙකක් අවශ්‍යයි. පලමුවැන්න කොළ අතු, පිදුරු වැනි ද්‍රව්‍යයයි. දෙවැන්න තෙතමනය සහිත පස්, පස් මෙ සඳහා උපයෝගීකර ගන්නා විට එහි තෙතමනය ගැන මනාසේ සැළකිලිමත් වන්න. ඔබ ගන්නා පස් වියලි නම්, එයට ජලය මුසු කරන්න ඒත් වැඩියෙන් නොවේ. තෙතමනය ඇතිවන තෙක් පමණයි ... .... ඒ කරුණු ඉතා වැදගත්

ඔබ කළ යුත්තේ පළමුවෙන් කොළ අතු ප්‍රමාණය පොලවේ රවුමට තුනී කිරීමයි. ඉන්පසුව සත්ත්ව පොහොර ඒ මත අතුරන්න. අනතුරුව තෙතමනය සහිත පස් එක්කරන්න. මෙම ගොඩවල් තුනට තවත් යමක් කළ යුතුය. ඒ මෙම ගොඩ වැසෙනසේ මඩ තට්ටුවක් ඇති කිරීමයි. එමගින් සුළං කාන්දුවීම වැළැක්වේ. මෙම මඩ ඇතිරිල්ල වටා ගනව දැමීම වඩාත් හොඳයි.

මෙලෙස සකස් කල පොහොර තොගය සතියක් දින දහයක් තුලදී ඉතා උෂ්ණයක් ඇතිවේ. ඒ ගැන නොතකන්න. එලෙසවීම අවශ්‍යය. මේ කාලය තුලදී ඉතා වැදගත් දෙයක් සිදුවේ. ඒ කොල අතු දිරන අතර, පොහොර වල ඇති විෂබීජ විනාශවීමයි. ඒ සමගම, පැලෑටි වලට අවශ්‍ය නයිට්‍රජන්ද සුළඟට මුසුවීම වැළැක් වීම නිසා විනාශ වන්නේ නෑ. ඔබට බලා ගන්නට බැරි වුවත්, ඒවා පොහොර තුලටම එක්වේ.

ඉතින් මේ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ගත යුත්තේ එක්තරා අනුපාතයකට අනුවයි. කොළ අතු එක් ප්‍රමාණයකට බාල්දියක ප්‍රමාණයකට කියා සිතමු. එසේ නම් පොහොර ගතයුත්තේ එම ප්‍රමාණයට මයි. තෙතමනය සහිත පස් බාල්දි තුනකට අවශ්‍ය වෙනවා. ඔබ සකස් කරන පොහොර මෙයට වැඩි ප්‍රමාණයක් වුවත් සාදගත හැකියි. එහෙත් මේ අනුපාතයට ද්‍රව්‍ය මිශ්‍ර කිරීමට අමතක කරන්න එපා.


සතියක් දින දහයක් කාලයක් තුලදී මෙලෙස තැබූ පොහොර, මඩ පටලය ඉවත්කල විට පොහොර සැකසී ඇති ආකාරය ඔබට දැනගත හැකියි. සියල්ලම කළු පැහැගැන්වී ඇති බව ඔබට පෙනෙනු ඇත. මෙය විවෘත කළවිට ඔබ කළයුත්තේ සියල්ල හොඳට මිශ්‍ර කිරීමයි. එය අවසන්වූ වහාම් ඔබේ වගාවට සුදුසු පොහොර සූදානම්.

මේ පොහොර වලට චීන ගොවියන් කියන්නේ "සකස් කළ පොහොර" ඒවා සෑම වගාවකටම ඔවුන් උපයෝගීකර ගන්නවා.

දන් ඔබට යෝජනාවක්. ඔබ මෙම පොහොර සැකසීමේ ක්‍රමය අත්හදා බලන්නට කැමති ? එසේ නම් ඔබේ ගෙවත්තේ කොටසකම මෙම ක්‍රමය ආරම්භ කරන්න. එයින් කාලයත් වැඩි මහන්සියකුත් ඉතුරු වෙනවා.

අනික් කරුණ මෙම පොහොර සැකසිය යුත්තේ ඔබේ භෝගයට එය අවශ්‍ය වෙලාවටය. පොහොර යොදන්න සතියකට දින දහයකට පෙර.

එසේ නම් දන්නවා මෙම පොහොර සැකසීමේ පිළිවෙල. මෙම පොහොර සකසන කාලය වැසි සහිත නම්, පොහොර ගොඩ යමකින් වසන්න. එය වසා තබා කාලය ටිකක් වැඩි කරන්න. පොහොර සැකසුන වහාම එය යොදන්නට ඔබට පුළුවන්.




(1) පියවර 1 : පළමුව කොළ අතු මෙලෙස අතුරන්න




(2) පියවර 2

එයට පසුව පොහොර ප්‍රමාණයක් ඒ මත අතුරන්න



(3) පියවර 3 :

පොහොර මෙන් තුන් ගුණයක්, තෙතමනය ඇති පස් අතුරන්න



(4) පියවර 4 : එම ගොඩ මඩ වලින් ආවරණය කරන්න

(5) පියවර 5

එම පොහොර පසියක්-දින 10 ක් ඇතුළත නොපෙරළා තබන්න



(6) පියවර 6 :

I. දැන් පොහොර ගොඩ හොඳට මිශ්‍ර කරන්න

II. සකස් කළ පොහොර දැන් යෙදීමට සුදුසුය.

## පොහොර සැපයීමේ අවස්ථා